# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2050/36 - 2017 දෙසැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2017.12.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලය පිහිටුවීමට අදාළව, එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද, 1999 අගෝස්තු මස 17 වන දින අංක 1093/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද (2017 සැප්තැම්බර් 21 වැනි දින අංක 2037/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමය මගින් අවසන් වරට සංශෝධිත) නියමයේ උපලේඛනය, එකී උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය'' යන සටහනට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන ''රක්ෂණ හා තක්සේරු අධ්‍යයන අංශය'' යන සටහනට ඉක්බිතිවම පහත දැක්වෙන සටහන එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය.''.

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

01 - 178


1A - PG 3835 — 508 (2017/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*